ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

14(1)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2023-01-31 |

පැමිණිලිකරු : තරිඳු ජයවර්ධන මයා,
ප්‍රධාන සංස්කාරක,
Medialk.com වෙබ් අඩවිය,
176/3, ඔරුතොට, ගම්පහ.

වගඋත්තරකරු : ලේකම්,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 163, ඇසිදිසි මැදුර,
කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

<u>පැමිණිලි අංක : **HRC/1044/21**</u>

**පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති කරුණු හා ඉල්ලා සිටින සහනයන් :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, තම වෙබ් අඩවිය වන **Medialk.com** වෙබ් අඩවිය ලියාපදිංචි කිරීම සඳහා 2019 වසරේ ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයදුම්පතක් ඉදිරිපත් කළ අවස්ථාවේ ඊට අදාළව සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බවත්, ඉන් පසු වෙබ් අඩවිය ලියාපදිංචියට පෙර ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිශ්කාශන වාර්තාවක් ලබා ගත යුතු බවට ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් දැනගන්නට ලැබුණු බවත්, තම වෙබ් අඩවිය ගැන ආරක්ෂක අමාත්‍යාංශයෙන් "ක්ලියර්" නොමැති බව දන්වා වාර්තාවක් එවා ඇති නිසා ලියාපදිංචිය ලබා දිය නොහැකි බව තමන් වෙත වගඋත්තරකාර පාර්ශවය දැන්වූ බවත් සඳහන් කර ඇත.

නිශ්චිත නීතියක් නැතත් ප්‍රවෘත්ති හෝ කාලීන සිදුවීම් වාර්තා කරන වෙබ් අඩවි ලියාපදිංචි කිරීම ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් සිදුකරන අතර, ජනමාධ්‍යවේදීන් සඳහා ජනමාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරනු ලබන්නේ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් වන අතර,



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචිය නොලැබෙන වෙබ් අඩවි වල ජනමාධ්‍ය වේදීන් සඳහා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ජනමාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකරන බව පැමිණිල්ලෙන් දක්වා ඇත.

මේ නිසා රජයේ යම් යම් ප්‍රවෘත්ති සාකච්ඡා හා ඇතැම් උත්සව ආවරණය කිරීම සඳහා ජනමාධ්‍ය හැඳුනුම්පත අනිවාර්යය කිරීම තුළ ලියාපදිංචි නොකළ වෙබ් අඩවි වල මාධ්‍ය වේදීන්ට රජයේ මාධ්‍ය හමු ඇතුළු ඇතැම් උත්සව ආවරණය කිරීමට අවස්ථාව නොලැබෙන බවත්, ඒ හේතුවෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය හා භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සීමාවන බවත් දක්වා ඇත.

මේ අනුව පැමිණිලිකරුගේ Medialk.com වෙබ් අඩවිය ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමට නිර්දේශ කරන ලෙසත්, තම වෙබ් අඩවියේ සේවය කරන ජනමාධ්‍ය වේදීන් සඳහා ජනමාධ්‍ය හැඳුනුම්පත නිකුත් කිරීමට ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට නිර්දේශ කරන ලෙසත් මෙම පැමිණිල්ල මගින් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

වගඋත්තරකරුගේ ප්‍රකාශය :-

වගඋත්තර පාර්ශවය විසින් මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2011.11.05 දිනැතිව නිකුත් කරන ලද ප්‍රවෘත්ති නිවේදනයක් අනුව පුවත් වෙබ් අඩවි ලියාපදිංචිය සිදු කරනු ලබන බවත්, ඒ අනුව පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීම අදාළ වෙබ් අඩවි හිමිකරු කැඳවා සම්මුඛ පරීක්ෂණයක් සිදුකිරීමෙන් හා ආරක්ෂක නිශ්කාශන ලබා ගැනීමෙන් පසුව සිදුකරනු ලබන බවත්,

www.medialk.com පුවත් වෙබ් අඩවිය ආරක්ෂක නිශ්කාශන ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරන ලද බවත්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් එවන ලද රහස්‍ය ලේඛනය අනුව මෙම වෙබ් අඩවිය සඳහා ප්‍රමාණවත් මට්ටමේ ආරක්ෂක නිශ්කාශන ලැබී නොමැති බැවින් පැමිණිලිකරුගේ වෙබ් අඩවිය ලියාපදිංචි කිරීමට කටයුතු කර නොමැති බවත් දක්වා ඇත.

නිරීක්ෂණ හා නිගමන :-

පැමිණිලි පාර්ශවය විසින් පවත්වාගෙන යන **Medialk.com** වෙබ් අඩවිය 2019 වර්ෂයේදී ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ අවස්ථාවේ ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සම්මුඛ පරීක්ෂණයක්ද කැඳවා ඇති අතර, ඉන් පසු ජනමාධ්‍ය

අමාත්‍යාංශය විසින් වෙබ් අඩවිය ලියාපදිංචි කිරීමට පෙර ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිශ්කාශන වාර්තාවක් ලබා ගැනීම සඳහා යොමු කර ඇත. ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2020-09-10 දිනැති රහස්‍ය වාර්තාවක් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, එහි සඳහන්ව ඇත්තේ, මෙම වෙබ් අඩවිය සඳහා ප්‍රමාණවත් මට්ටමේ ආරක්ෂක නිශ්කාශන ලැබී නොමැති බවයි. එම නිසා මෙම වෙබ් අඩවිය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීමට කටයුතු කර නොමැති බව වගඋත්තරකාර පාර්ශවය දන්වා ඇත.

ජනමාධ්‍ය අමාත්‍යාංශය 2021-06-23 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමු කර ඇති වාර්තාව අනුව 2011-11-05 දිනැතිව නිකුත් කරන ලද ප්‍රවෘත්ති නිවේදනයක් අනුව පුවත් වෙබ් අඩවි ලියාපදිංචිය සිදුකරන බවත්, ඒ අනුව වෙබ් අඩවි ලියාපදිංචි කිරීම අදාල වෙබ් අඩවි හිමිකරු කැඳවා සම්මුඛ පරීක්ෂණයක් සිදුකිරීමෙන් හා ආරක්ෂක නිශ්කාශන ලබා ගැනීමෙන් පසුව සිදුකරන බවත් දන්වා ඇත.

නමුත් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2022-04-19 පැවති පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය දන්වා ඇත්තේ, අංක 12/1037/537/0191 හා 2021-08-13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පුවත් වෙබ් අඩවි අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති බවකි. මේ අනුව පුවත් වෙබ් අඩවි අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීම කුමන පදනමකින් සිදුකරන්නේද යන්න පිළිබඳව වගඋත්තර පාර්ශවය පරස්පරතා කරුණු දැක්වීමක් කර ඇති බව නිරීක්ෂණය වේ.

2022-04-19 පැවති විමර්ශනයේදී වගඋත්තරකාර පාර්ශවය තවදුරටත් දන්වා ඇත්තේ, 2019 පාස්කු ප්‍රහාරයෙන් පසුව වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේදී ආරක්ෂක නිශ්කාශන ලබා ගත යුතු බවට ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් තීරණය කරන ලද බවත්, ඒ අනුව 2020-09-10 දින ආරක්ෂක අමාත්‍යාංශයේ මාධ්‍ය කේන්ද්‍රය විසින් ජනමාධ්‍ය අමාත්‍යාංශයට යොමුකරන ලද රහස්‍ය වාර්තාවට අනුව මෙම පැමිණිලිකරුගේ වෙබ් අඩවිය වන www.medialk.com වෙබ් අඩවිය 4වන මට්ටමේ ආරක්ෂක නිශ්කාශන එනම් "General risk to national security" යටතේ දක්වා ඇත. එසේම 2020-10-28 දින පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා රැස්වූ කමිටුව විසින් කාණ්ඩ 05 යටතේ ආරක්ෂක නිශ්කාශන ලබාදී ඇති පුවත් වෙබ් අඩවි පමණක් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට තීරණය කල බවද දන්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කරුණ සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති 2020-10-28 දිනැති ජනමාධ්‍ය අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවති "පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේ

ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා වූ රුස්වීමේ වාර්තාව" මැයෙන් වූ ලේඛනයේ ඒ සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ නාමලේඛනය පිළිබඳව අවධානය යොමු කිරීමේදී ඊට සහභාගී වී ඇත්තේ, ජනමාධ්‍ය අමාත්‍යාංශය, යුධහමුදා ප්‍රකාශක, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය යන ආයතන වල නිලධාරීන්ය.

එසේම මෙම 2020-10-28 දිනැති රුස්වීම් වාර්තාවේ වැඩිදුරටත් දක්වා ඇත්තේ, 2020 වර්ෂයේ අයදුම්පත් ඉදිරිපත් කරන ලද පුවත් වෙබ් අඩවි සඳහා මීට පෙර 2020-07-14 දින පැවති රුස්වීමේදී ගනු ලැබූ තීරණ ප්‍රකාරව ආරක්ෂක නිශ්කාශන වාර්තාවක් ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් කැඳවන ලද බවත් 2020-09-10 දිනැතිව ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් යොමු කරන ලද එම වාර්තාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම මෙම රුස්වීමේ අරමුණ වූ බවද දක්වා ඇත. ඒ අනුව 2020-07-14 දින පැවති රුස්වීමේ සටහන්ද කොමිෂන් සභාවේ අවධානයට වගඋත්තරකාර පාර්ශවය යොමු කර ඇති අතර, එහි සඳහන් වන්නේ ජාතික ආරක්ෂාවට හා සංහිඳියාවට තර්ජනයක් නොවන අයුරින් පුවත් වෙබ් අඩවි පවත්වාගෙන යාම වැදගත් කොට සලකන බැවින් මෙම වෙබ් අඩවි අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීමේ හා අළුත් කිරීමේ ක්‍රමවේදය නැවත සමාලෝචනය කිරීම සඳහා සාකච්ඡාවක් ලෙස මෙම රුස්වීම පැවති බවයි. එම රුස්වීම සඳහා සහභාගී වී තිබුණේ තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ,යුධ හමුදා මාධ්‍ය ප්‍රකාශක, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන යන ආයතන වල රාජ්‍ය නිලධාරීන්ය. මෙම රුස්වීමේදී 5වන කාරණය ලෙස වෙබ් අඩවි ලියාපදිංචි කිරීම යන කාරණා යටතේ ගනු ලැබූ තීරණය ලෙස "දැනට ඉදිරිපත් වී ඇති නව ලියාපදිංචි හා අළුත් කිරීම් තොරතුරු විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබා දීම" ලෙස දක්වා ඇත.

මේ අනුව පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේදී ජනමාධ්‍ය අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු වීමට හේතු වූ කරුණු පැහැදිලි කර ඇති අතර මෙම ක්‍රියාමාර්ගය නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්ථාපිත කර ඇති භාෂණයේ නිදහස හා ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස කොතරම් දුරට සීමා වන්නේද එම සීමා කිරීම් කොතරම් දුරට නීත්‍යානුකූලද යන්න කොමිෂන් සභාවේ අවධානයට ලක්කර ඇත. ඒ අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) අ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති භාෂණයේ නිදහස ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස සීමා කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(2) හා 15(7) අනුව්‍යවස්ථාවල ප්‍රතිපාදනයන්ට යටත්ව පමණක් බව අවධාරණය කළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(2) ව්‍යවස්ථාවට අනුව "14(1) අ ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්තිවිඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද වාර්ගික හා ආගමික සහයෝගීතාවය තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාසය හෝ වරදකට

පෙළගැස්වීම හා සම්බන්ධ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් වලට යටත්වය." 15(7) ව්‍යවස්ථාව අනුව 12,13 (1),(2) හා 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති සියළුම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද ක්‍රියාත්මක විය හැක්කේද රාජ්‍ය ආරක්ෂාව ද රටේ යථා පැවැත්ම තහවුරු කිරීම පිණිසත් මහජන සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත් අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නත් වැදැරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට හා ඊට නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිණිසත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය සඳහා යුක්ති සහගතව අවශ්‍යතා සපුරාලීම පිණිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් වලට යටත්වය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය" යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත්කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේය". ලෙසත් එහි වැඩිදුරටත් දක්වා ඇත.

නමුත් ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා වූ රැස්වීම් වලදී එනම් 2020-10-28 හා 2020-07-14 දින ගන්නා ලද තීරණ කිසිදු අවස්ථාවක නීතියක් හෝ නියෝගයක් නොවන බැවින් එම තීරණ මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) අ යටතේ ස්ථාපිත කර ඇති භාෂණයේ නිදහස හා ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස සීමා කළ නොහැක.

එසේම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඈ) ව්‍යවස්ථාව අනුව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියළු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුතුය. ආරක්ෂා කරනු ලැබිය යුත්තේය. වර්ධනය කරනු ලැබිය යුත්තේය. තවද ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට හා ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේය." යන නියමයද වගඋත්තර පාර්ශවයේ මෙම ක්‍රියා කලාපයන් තුලින් උල්ලංඝනය කර ඇති බව අනාවරණය වේ.

මේ අනුව ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් පැමිණිලිකරුගේ පුවත් වෙබ් අඩවිය ආරක්ෂක නිශ්කාශන ප්‍රමාණවත් නොවීම මතයැයි සඳහන් කරමින් පිළිගත් නිත්‍යානුකූල නොවන ක්‍රමවේදයක් ඔස්සේ අදාළ වෙබ් අඩවිය ලියාපදිංචි නොකර සිටීමට කටයුතු කිරීම තුලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) අ යටතේ ස්ථාපිත කර ඇති භාෂණයේ නිදහසට හා ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට ඇති අයිතිය උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

මෙම කරුණු අනුව. සමස්ථ සමාජයේම තොරතුරු දැනගැනීමේ අයිතියට බලපාන කරුණක් වන පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය තිරණය කිරීමට රාජ්‍ය ආයතන පමණක් සම්බන්ධ කරගෙන තිරණවලට එළඹ තිබීමද. ප්‍රායෝගික නොවන බව නිරික්ෂණය වන අතර මේ සදහා රාජ්‍ය මාධ්‍ය ආයතන පෞද්ගලික මාධ්‍ය ආයතන මෙන්ම ජනමාධ්‍ය අමාත්‍යංශයේ ලියාපදිංචි පුවත් වෙබ් අඩවි මෙන්ම ලියාපදිංචි වීමට අයදුම්පත් ඉදිරිපත් කර ඇති පුවත් වෙබ් අඩවි නියෝජිතයින්ද මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන විශේෂඥයින්ගේද සහභාගිත්වය ඇතිව වඩාත් විනිවිදභාවයක් ඇති නිත්‍යානුකූල ක්‍රමවේදයක් සකස් කිරීමට ජනමාධ්‍ය අමාත්‍යංශය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 02 . 28 වන දිනට පෙර මෙම නිර්දේශය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙෂ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- අමාත්‍යතුමා.
ජනමාධ්‍ය අමාත්‍යංශය.
අංක 163. ඇසිදිසි මැදුර.
කිරුළපන මාවත.
පොල්හේන්ගොඩ. කොළඹ 05.

B/